විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය

தலைமுறையொன்றின் பெருமிதம்

Pride of a Generation


මගේ අංකය
எனது இல.
My No. } Pen/Pol/06/20-2023

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2025.10.16

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>දුම්රිය ගමන් බලපත්‍ර තාවකාලිකව මාර්ගගත නොවන ක්‍රමවේදය ඔස්සේ නිකුත් කිරීම</u>**

ලංකා රාජ්‍ය මේඝය (Lanka Government Cloud) සේවාවේ ඇති වී තිබෙන තාක්ෂණික දෝෂයක් මත විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය තාවකාලිකව අක්‍රිය වී ඇති බැවින් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු මේ වන විට සිදු කිරීමට නොහැකි වී ඇත. දත්ත පද්ධතිය නැවත යථා තත්ත්වයට පත්වන තෙක් විශ්‍රාමිකයින් වෙත නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කිරීම අත්‍යවශ්‍ය අවස්ථාවන්හි දී පමණක් ඊට අදාළව පහත පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

i. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙතින් නිකුත් කර ඇති දැනට ඔබ කාර්යාලයේ පවතින ආකෘති පත්‍රය භාවිතා කරමින් දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතු ය. ආකෘති පත්‍රයේ දෙපාර්තමේන්තු සංකේත අංකය වශයෙන් 4440/3 ඇතුළත් කළ යුතු අතර, අදාළ වැය ශීර්ෂය වන්නේ 253-1-2-5-1502 වේ. (සංකේත අංකය, වැය ශීර්ෂය හා විශ්‍රාමික අංකය ආකෘති පත්‍රයේ මුද්‍රණය කර නොමැති අවස්ථාවල දී එම තොරතුරු සටහන් කිරීමට කටයුතු කළ යුතු ය.)

ii. මේ අනුව නිකුත් කළ යුත්තේ යාමට හා ඒමට දෙන එක් බලපත්‍ර කට්ටලයක් පමණි.

iii. මෙම බලපත්‍ර කට්ටලය නිකුත් කිරීමේ දී 2025 වර්ෂයේ මේ දක්වා බලපත්‍ර කට්ටල 03ක් ලබා ගෙන නොමැති බවට විශ්‍රාමිකයා වෙතින් තහවුරුවක් ලබා ගත යුතු ය.

iv. ඉහත පරිදි බලපත්‍ර නිකුත් කිරීම සිදු කළ හැක්කේ 2025.10.22 දින තෙක් වූ කාලසීමාව තුළ යෙදෙන හදිසි හා අත්‍යවශ්‍ය ගමන් සඳහා පමණක් වන අතර, නිකුත් කරනු ලබන බලපත්‍ර පිළිබඳව තොරතුරු ඇතුළත් වාර්තාවක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු ය.

Achini


චාමින්ද හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

දුරකථනය : 011 2 421786
ෆැක්ස් : 011 2 431413
විද්‍යුත් ලිපිනය : pen7policydep@gmail.com



මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk


Scanned with CamScanner